මනෝරම්‍ය පෙදෙසක ඇති අසුනක් මත වාඩිවී සතුටු සාමිච්චි කතාවෙහි යෙදී සිටින මේ තරුණ යුවල හමුවට පැමිණි සිඟන් තියක්, ඇගේ කුඩා දරුවාට කෑමට යමක් ගැනීමට මුදලක් ඉල්ලන්ට වනි. සාක්කුවට අත යැවූ තරුණයා සෑහෙන මුදලක් ඇය අත තැබුවාය. මඳ වේලාවක් කල්පනා සාගරයේ නිමග්නවූ නිමල් සූරවීර නම් මුම්ම තරුණ උපාධිධරයාත් ඔහුගේ ප්‍රියාවත් හුනස්නෙන් නැගිට සවතිය මොටෝ රථය කරා පා තැබුවෝය.

තම දිවි පෙවෙත ගෙන යෑම පිණිස පුතට යමක් ඉල්ලා බෝහෝ දෙනෙකුගේ ඇණුම් බැණුම්වලට ලක්වන කාලකන්නි මෑලි මේ ත්‍යාගශීලී මහතාණන්ගෙන් ලැබුනු මුදලත් රැගෙන සිය අම්බලම කරා ගමන් කළාය. ඇගේ ඉරණම කුමක්වීද යනු විසඳීම ඔබට බාර කරමු.

එලිබිච්චිය වලව්ව
පන්තල.

# කුඹුරුවල අස්වැන්න වැඩිකරගන්නේ කෙසේද?

කුඹුරු අක්කරයකින් වැඩිපුර අස්වැන්න ලබාගැනීම සඳහා විශිෂ්ට ප්‍රතිඵල ගෙන දෙන ක්‍රම තුනක් යෙදිය හැක. ඇතැම්විට කුඹුරු අක්කරයකින් වී බුසල් 75 සිට 100 දක්වා අස්වැන්න ලබා ගැනීමට එම ක්‍රම තුන යෙදීමෙන් ඔබට හැකි වෙතවා ඇත. උසස් ප්‍රතිඵල ලබා දෙන ඒ ක්‍රම තුන මොනවාද ?

(1) **නුමුහුන් බිත්තර වී පාවිච්චි කිරීම.**
(2) **පැල ඉන්දවීම. (Transplating)**
(3) **දූනි පෝරු පාවිච්චිය.**

යනු ඒ ක්‍රම තුනයි.

උතුරු මැද පළාතේ ඇතැම් වෙල්යායක අක්කයකට ගොමපෝර ටොන් එක බැගින් යොදා වී වපුරා දූනිපෝරුවෙන් පෝරුගා සකස්කර ගැනීමෙන් සමහර කුඹුරුවලින් අක්කරයකට වී බුසල් 100 කට වැඩි අස්වැන්නක් ලැබෙන බව දැනගන්නට ලැබී තිබේ. අවශේෂ කුඹුරුවලින් ලැබුනේ බුසල් 40 සිට 60 දක්වා අස්වැන්නකි. කවර වෙල්යායක වුවද අස්වැන්න වැඩි කර ගැනීමට නම් අපරට ගොවි මහතුන් විසින් සිතට ගතයුතු– ක්‍රියාවෙහි යෙදියයුතු– ප්‍රධාන කරුණු තුන ඉහත දක්වා තිබේ. අවධාරණය පිණිස එය නැවතත් සඳහන් කරමු.

(1) නුමුහුන් බිත්තර වී පාවිච්චි කිරීම, 2) දූනි පෝරු පාවච්චිය, (3) පැල ඉන්දවීම–

මේ කරුණු තුණ ගැන සැලකිලිමත් වන ගොවි මහතෙකුට අස්වැන්න කපා ගන්නා කාලයේදී කිසිසේත් පසුතැවිලි වීමට සිදු නොවේ. ඒ වෙනුවට ලැබෙනුයේ ප්‍රීතියෙකි! වැඩි අස්වැන්න දැකීමෙන් ලැබෙන ඉමහත් ප්‍රීතියෙකි.

නුමුහුන් බිත්ර වී බෙදා හැරීම පිණිස කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හැම උත්සාහයක්ම දරයි. මෙම බිත්තර වී නුමුහුන්ව ආරක්ෂා කරන්නේ ආණ්ඩුවේ බීජ ගබඩා වලය. පෞද්ගලික ගොවිපලවල හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ගොවිපලවලද නුමුහුන් බිත්තර වී බෝ කරනු ලැබේ. මේ වර්ෂයේ එවැනි බිත්තරවී ගොවිපලවල් 900 යකට ඉහළින් තිබේ. ගොවිපලවල වර්ග ප්‍රමාණයද අක්කර 600 යකින් පමණ වැඩි කර තිබේ. 1949 වර්ෂයේ දෙපාර්තමේන්තු

Do not wait—Cultivate!

බලා නොසිටින්න! ගොවිතැන් කරන්න!

වේ ගොවිපළවලින් හා පෞද්ගලික ගොවිපළවලින්ද නුමුහුන් බිත්තර වී බුසල් හැත්තෑ හත් දහසකට වැඩියෙන් ගොවීන් අතර බෙදා හැර තිබේ. 1949 යේදී වැපිරීම සඳහා යොදන ලද සම්පූර්ණ නුමුහුන් බිත්තර වී ප්‍රමාණය බුසල් හැත්තෑහත්දහසකට පමණක් සීමා කළ නොහැකිය. මන්ද ? පෞද්ගලික වශයෙන් නුමුහුන් බිත්තර වී නිපදවා ප්‍රයෝජනයට ගන්නා ගොවීන් මහත් සංඛ්‍යාවක් ලංකාවේ සෑම පළාත්වලම සිටින බැවිනි.

දෙපාර්තමේන්තුව මගින් මුදල් දීමෙන්ද වී වලට වී දීමෙන්ද නුමුහුන් බිත්තර වී සපයා ගනු ලැබේ. පෞද්ගලික ගොවිපළවලද නුමුහුන් බිත්තර වී සැලකිය යුතු ප්‍රමාණයක් නිපදවනු ලැබේ. 1949 – 50 මාස්කන්නේදී උතුරුමැද පළාතේ ගොවිපළවල පමණක් නුමුහුන් බිත්තර වී බුසල් පනස්හයදහස් අට සියයකට වඩා නිපදවා තිබේ. මෙයින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් බිත්තර වී සඳහා බුසල් දහතුන්දහසක් පමණ මිලදී ගෙන තිබේ. ගොවි මහතුන් විසින් නිපදවනු ලබන නුමුහුන් බිත්තර වී සියල්ලම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ලබා ගත නොහැක. ඊට ප්‍රධාන හේතුව පෞද්ගලික ගොවි මහතුන් විසින් නිපදවනු ලබන බිත්තර වී වැඩිමිලට පිටස්තර අයට විකුණා ගතහැකි වීමය. තමන් විසින් වැඩිපුර නිපදවනු ලබන නුමුහුන් බිත්තර වී සියල්ලම කෘෂිකර්මාන්ත දෙපාර්තමේන්තුවට ලැබෙන්නට සලස්වන්නේ නම් එය තම රට - ජාතිය වෙනුවෙන් කරනු ලබන මහඟු සේවයකි.

සංසන්දනය කර බැලීම පිණිස ඌව පළාතේ 1949–50 මාස්කන්නයේ සංඛ්‍යා ලේඛන මෙහි පහත දක්වනු ලැබේ. සාත්තු කරන ලද කුඹුරු අක්කරයකින් ලැබෙන අස්වැන්නේත් සාත්තු නොකරණ ලද කුඹුරු අක්කරයකින් ලැබෙන අස්වැන්නේත් වෙනස ඔබට පහත දක්වෙන ලේඛනයෙන් මනාව අවබෝධ කරගත හැකිවනු ඇත.

| කොට්ඨාශය | කුඹුරු වැපිරූ හැටි | සාත්තු කරණ ලද අක්කරයකට වැටෙන අස්වැන්න ප්‍රමාණය (බුසල්) | සාත්තු නොකරන ලද අලල්පු කුඹුරු වල අක්කරයකට වැටෙන අස්වැන්න ප්‍රමාණය (බුසල්) | වැඩි අස්වැන්න ප්‍රමාණය (බුසල්) |
|---|---|---|---|---|
| උඩුකිඳ | පැල ඉන්දවීම පමණයි | 43.0 | 24.0 | 19.0 |
| | පැල ඉඳුවා පෝර දැමීම | 49.86 | 23.57 | 26.29 |
| | වී ඉසීම හා පෝර දැමීම | 38.02 | 26.68 | 11.34 |
| යටි කිඳ | පැල ඉන්දවීම පමණයි | 54.9 | 29.3 | 25.6 |
| වෙල්ලස්ස | පැල ඉන්දවීම පමණයි | 74.1 | 22.4 | 51.7 |
| බින්තැන්න | සී සෑම දැති පෝරු ගෑම, සහ පැල ඉන්දවීම | 84.25 | 23.75 | 60.5 |
| බුත්තල | සී සෑම දැති පෝරු ගෑම, සහ පැල ඉන්දවීම | 62.0 | 30.0 | 32.0 |



දරුවන් උදෙසා ආහාර වගා කරන්න!